# TRADE

# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# වෙළෙඳාම

ගැණුම්කරුවෙකු හා විකුණුම්කරුවෙකු අතර කිසියම් ප්‍රතිෂ්ඨාවකට නිෂ්පාදිත භාණ්ඩ හා සේවාවල අයිතිය හුවමාරු වීමේ ක්‍රියාවලිය වෙළෙඳාම ලෙස අර්ථ දැක්විය හැකි ය.

# වෙළෙඳාමේ ප්‍රභේද

**වෙළෙඳාම**

- **දේශීය වෙළෙඳාම**
  - **සිල්ලර වෙළෙඳාම**
  - **තොග වෙළෙඳාම**
- **විදේශීය වෙළෙඳාම**
  - **ආනයන වෙළෙඳාම**
  - **අපනයන වෙළෙඳාම**

ClassWork.LK

# <u>දේශීය වෙළෙඳාම</u>

දේශීය වෙළෙඳාම (Home Trade) යනු යම් රටක දේශ සීමාව තුළ සිදු වන වෙළෙඳාම වේ.

## <u>දේශීය වෙළෙඳාමේ ප්‍රභේද</u>

- තොග වෙළෙඳාම
- සිල්ලර වෙළෙඳාම

# <u>විදේශීය වෙළෙඳාම</u>

විදේශීය වෙළෙඳාම (Foreign Trade) යනු යම් රටක් වෙනත් රටක් හෝ රටවල් සමග සිදු කරන වෙළෙඳාම වේ.

## <u>විදේශීය වෙළෙඳාමේ ප්‍රභේද</u>

- ආනයන වෙළෙඳාම
- අපනයන වෙළෙඳාම

ClassWork.LK

# පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග

(1) නිෂ්පාදකයා → පාරිභෝගිකයා

(2) නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

(3) නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

(4) නිෂ්පාදකයා → නියොජිතයින් → තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ බෙදා හැරීමේ මාර්ග රාශියක් ඇති බව ඉහත සටහනින් පැහැදිලි වේ.

- අංක (1) න් පෙන්නුම් කරන්නේ නිෂ්පාදකයා කෙළින් ම පාරිභෝගිකයා වෙත භාණ්ඩ බෙදා හැරීමයි. (ඍජු බෙදාහැරීම )

- අංක (2) (3) (4) බෙදා හැරීමේ ක්‍රියාවලීන්හි දී අතරමැදියන් සම්බන්ධ වී ඇත.

ClassWork.LK

# අතරමැදියන්

අතරමැදියන් යනු නිෂ්පාදිත බොදාහැරීමේ දී නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සිටින බෙදාහැරීමේ ක්‍රියාවලියට සම්බන්ධ වන පාර්ශ්ව වේ.

අතරමැදියන් ලෙස පහත පාර්ශ්ව හැඳින්විය හැකි ය.

- තොග වෙළෙන්ඳා
- සිල්ලර වෙළෙන්ඳා
- නියෝජිතයින්

ClassWork.LK

## තොග වෙළෙන්ඳා

නැවත විකිණීම සඳහා නිෂ්පාදිත අලෙවි කරන්නන් තොග වෙළෙඳුන් ලෙස හැඳින්වේ.

## සිල්ලර වෙළෙන්ඳා

අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා අලෙවි කරන්නන් සිල්ලර වෙළෙඳුන් ලෙස හැඳින්වේ.

## නියෝජිතයින්

කිසියම් ප්‍රධානියකුගේ බලය පිට යම් කාර්යයක නිරත වන්නන් නියෝජිතයින් ලෙෂ හැඳින්වේ. නියෝජිතයා තමාගේ ප්‍රධානියා වෙනුවෙන් වගකීම් භාරගනී. ඒ වෙනුවෙන් ඔහුට කොමිස් මුදලක් හිමි වේ.

ClassWork.LK

# නියෝජිතයින් ඔවුන් සපයන සේවා අනුව වර්ග කිරීම

**වෙළෙඳාම**

| | | | | |
|---|---|---|---|---|
| කොමිස් නියෝජිතයා | බ්‍රෝකර්වරු/ තැරැව්කරු | සාධ්‍යකයා | කැපකරු නියෝජිතයා | වෙන්දේසිකරු |

## කොමිස් නියෝජිතයා

ප්‍රධානියාට වාසිදායක වන ලෙස තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමක් හෝ විකිණීමක් සිදු කරමින් ඒ මත කොමිස් මුදලක් ලබා ගන්නා නියෝජිතයා කොමිස් නියෝජිතයා වේ.

## තැරැව්කරු

ගනුදෙනුවට අදාළ ගැනුම්කරු හා විකුණුම්කරු සම්මුඛ කරමින් ගනුදෙනුව සිදු වීමට අවශ්‍ය තොරතුරු සපයා සමහර විට විකුණුම්කරුගෙන් ද සමහර විට ගැනුම්කරුගෙන් ද සමහර විට දෙපාර්ශ්වයෙන් ම ද තම සේවය වෙනුවෙන් තැරැව් ගාස්තුවක් ලබා ගන්නා නියෝජිතයා තැරැව්කරු වේ.

ClassWork.LK

## සාධ්‍යකයා

ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිල දී ගැනීමේ දී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් ම සිදු කරනු ලබන නියෝජිතයා සාධ්‍යකයා වේ.

## කැපකරු නියෝජිතයා

ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීම සිදු කර, එම ණය මුදල් අදාළ පාර්ශ්ව යන්ගෙන් එකතු කර දීමට ද කැප වෙමින් කටයුතු කරන නියෝජිතයා කැපකරු නියෝජිතයා වේ. ඔහුට සාමාන්‍ය කොමිස් මුදල්වලට අමතර ව කැපකරු කොමිස් මුදල් ද හිමි වේ.

## වෙන්දේසිකරු

විකුණනු ලබන භාණ්ඩ වෙනුවෙන් විවෘත ව හා වාචික ව ඉහළ ගණන් ඉදිරිපත් කළ ගැනුම්කරුවන්ට ප්‍රධානියාගේ භාණ්ඩ අලෙවි කරමින් එම කටයුතු සම්බන්ධීකරණය කරනු
ලබන පාර්ශ්වය වෙන්දේසිකරු වේ. මේ සඳහා ඔහුට වෙන්දේසි ගාස්තුවක් හිමි වේ.

ClassWork.LK

# වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි

## වාසි :

- විවිධ නිෂ්පාදකයින් නිපදවන භාණ්ඩ හා සේවා ලබා ගෙන අවශ්‍ය වේලාවට පහසු ස්ථානයක දී පාරිභෝගිකයාට ලබා දීමට කටයුතු කිරීම

- නව භාණ්ඩ හා සේවා හඳුන්වා දීම පහසු වීම

- වෙළෙඳපොළ තොරතුරු අදාළ පාර්ශ්වයන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම

- හුවමාරු ක්‍රියාවලිය සරල වීම

## අවාසි :

- වෙළෙඳපොළේ අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇති විය හැකි වීම

- භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකි වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# TRADE

# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

## සිල්ලර වෙළෙන්දා

අවසාන පාරිභෝගිකයාට භාණ්ඩ විකිණීම සිල්ලර වෙළෙඳාම ලෙස හැඳින්වෙන අතර එසේ විකුණන්නා සිල්ලර වෙළෙන්දා ලෙස හැඳින්වේ.

## සිල්ලර වෙළෙඳාමේ ලක්ෂණ

- අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීම

- විවිධ වර්ගයේ භාණ්ඩ රැසක් අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම

- පාරිභෝගිකයාට අවශ්‍ය ද්‍රව්‍ය, අවශ්‍ය ප්‍රමාණයෙන්, අවශ්‍ය ස්ථානයේ දී ලබා ගැනීමට ඉඩකඩ සලසා තිබීම

- බොහෝ විට ණය පදනම මත භාණ්ඩ අලෙවි කිරීම.

- පාරිභෝගිකයා සමග සමීප සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම

ClassWork.LK

# සිල්ලර වෙළෙඳුන්ගෙන් ඉටු වන සේවා :

## නිෂ්පාදකයාට

- නිෂ්පාදකයාගේ නව නිෂ්පාදිත පාරිභෝගිකයාට හඳුන්වා දීම

- ප්‍රදර්ශන පුවරු හෝ පෝස්ටර් ප්‍රදර්ශනය, සාම්පල් බෙදා දීම යනාදිය මගින් භාණ්ඩ ප්‍රවර්ධනයට සහාය වීම

- භාණ්ඩ අලෙවියෙන් පසු නිෂ්පාදිත පිළිබඳ පාරිභෝගික අදහස් හා අනෙකුත් අදාළ තොරතුරු නිෂ්පාදකයාට සැපයීම

## තොග වෙළෙන්දාට

- තොග වෙළෙන්දා රැස් කර ගත් භාණ්ඩ පාරිභෝගිකයා වෙත බෙදා හැරීම

- පාරිභෝගික රුචි අරුචිකම් හා වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු සැපයීම

- තොග වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය සඳහා දායක වීම

ClassWork.LK

# පාරිභෝගිකයාට

- අවශ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය වේලාවට සැපයීම

- ණය පදනම මත භාණ්ඩ සැපයීම

- නව භාණ්ඩ හඳුන්වා දීම හා අවශ්‍ය අවස්ථාවල දී උපදෙස් ලබා දීම

- පාරිභෝගික අවශ්‍යතා අනුව විවිධ වර්ගයේ භාණ්ඩ සැපයීම

- පාරිභෝගිකයාට විවිධ පහසුකම් සැපයීම (නිදඃ ප්‍රවාහන පහසුකම්, විද්‍යුත් ගෙවීම් ක්‍රම)

ClassWork.LK

# සිල්ලර වෙළෙඳාමේ ප්‍රවණතා

## සුපිරි වෙළෙඳසැල් රටපුරා ව්‍යාප්ත වීම

අතීතයේ නගරබද ප්‍රදේශවලට පමණක් සීමා වූ සුපිරි වෙළෙඳසැල් වර්ථමානයේ ගම්බද ප්‍රදේශවල ද ව්‍යාප්ත වීම

## නව තාක්ෂණය භාවිත කරමින් සිල්ලර වෙළෙඳසැල් ක්‍රියාත්මක වීම

**නිදසුන් :**

| | |
|---|---|
| මිල සටහන් කිරීම | - විද්‍යුත් මිල දර්ශන |
| තීරු සංකේත ක්‍රම | - Bar code |
| කිරුම් මිණුම් ක්‍රම | - විද්‍යුත් තරාදි/Digital scale |
| ගෙවීම් ක්‍රම | - ණයපත් / හරපත් භාවිතය |
| නිරීක්ෂණ ක්‍රම | - CCTV Camera system |

## විවෘත ව තබන කාල සීමාව දීර්ඝ කිරීම

**නිදසුන් :**

රාත්‍රී කාලය හා නිවාඩු දිනවල ඕනෑ ම අවස්ථාවක ගනුදෙනු කළ හැකි වීම

ClassWork.LK

## සේවා සැපයුම් සමග සිල්ලර වෙළෙඳසැල් සංයෝග වීම

**නිදසුන් :**

ලාෆ් ඉන්ධන පිරවුම්හල් සමග සුපිරි වෙළෙඳසැල් - Commercial mini Bank සමග Cargils සුපිරි වෙළෙඳසැල්

## ස්වයංක්‍රීය විකුණුම් යන්ත්‍ර

රසකැවිලි - චොක්ලට් - සිසිල්බීම

## නව කළමනාකරණ ශිල්ප ක්‍රම භාවිත කිරීම

ClassWork.LK

# වෙළෙඳසැල් රහිත සිල්ලර වෙළඳාම
# (Non store Retailing)

භාණ්ඩ මිල දී ගැනීමට පාරිභෝගිකයා වෙළෙඳසැල වෙත නො ගොස් දුරකථන, ෆැක්ස්, අන්තර්ජාලය, කැටලොග් භාවිතයෙන් භාණ්ඩ ඇණවුම් කර ලබා ගැනීමයි. මෙහි ආකාර දෙකකි.

- අන්තර්ජාල වෙබ් අඩවි හරහා සිදු වන විද්‍යුත් සිල්ලර වෙළෙඳාම Online Retailing
- සෘජු අලෙවිකරණය - Direct Marketing

ClassWork.LK

# සෘජු අලෙවිකරණය - Direct Marketing

අතරමැදියන් නො මැති ව නිෂ්පාදිත කෙලින් ම පාරිභෝගිකයා අතට පත් කිරීම

**නිදසුන් :**

- සෘජු තැපෑල - direct mail
- කැටලොග් Catalogues
- දුරකථන හා රූපවාහිනිය මගින්

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# TRADE
# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# තොග වෙළෙන්දා

නැවත විකිණීමේ චේතනාවෙන් මිල දී ගන්නා ගැණුම්කරුවන් වෙත නිෂ්පාදිත අලෙවි කිරීම තොග වෙළෙඳාම ලෙස හැඳින්වේ. එසේ නිෂ්පාදිත අලෙවි කරන්නා තොග වෙළෙන්දා වේ.

# තොග වෙළෙඳාමේ ලක්ෂණ

- නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලට ගැනීම
- භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීම
- වෙළෙඳ වට්ටම් ලබා දීම
- භාණ්ඩ තොග වශයෙන් ගබඩා කොට තිබීම
- අලෙවි ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
- වෙළෙඳපොළ පිළිබඳ පර්යේෂණ කිරීම
- තොග ප්‍රවාහනය කර දීම

ClassWork LK

# තොග වෙළෙන්දාගෙන් ඉටුවන සේවා

## නිෂ්පාදකයාට

- නිෂ්පාදකයාගේ නිෂ්පාදිත තොග වශයෙන් ලබා ගැනීම
- වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු ලබා දීම
- නිෂ්පාදකයාට විවිධ සේවාවන් සැපයීම

  **නිද :** මූල්‍ය පහසුකම්, අමුද්‍රව්‍ය ලබා දීම

## සිල්ලර වෙළෙන්දාට

- භාණ්ඩ තොග වශයෙන් සැපයීම
- සිල්ලර වෙළෙඳසැලට ම භාණ්ඩ ගෙනැවිත් දීම
- ණය පහසුකම් සැපයීම
- භාණ්ඩ තේරීම, ඇසිරීම, මිශ්‍ර කිරීම ආදී සේවාවන්හි නිරත වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# TRADE

# (Part-IV)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# විදේශ වෙළෙඳාම

යම් රටක් වෙනත් රටක් හෝ රටවල් සමග සිදු කරන වෙළෙඳාම විදේශ වෙළෙඳාම වේ.

# විදේශ වෙළෙඳාම සඳහා පදනම් වී ඇති සාධක

## ස්වභාවික සම්පත් බෙදී යාමේ විෂමතාව

යම් යම් රටවලට සමහර ස්වභාවික සම්පත් උරුම වී ඇති ආකාරය විෂම වීම නිසා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සිදු කළ හැක්කේ එම රටවලට පමණි

**නිදසුන් :**

මැද පෙරදිග - ඛණිජ තෙල්
ද. අප්‍රිකාව - රතත් රන්
ශ්‍රී ලංකාව - තේ

ClassWork.LK

## සාපේක්ෂ පිරිවැය වාසිය

රටක් භාණ්ඩ ආනයනය කිරීමට සාපේක්ෂ ව අඩු පිරිවැයකින් නිපදවිය හැකි නම් එම භාණ්ඩ නිපදවා අපනයනය කළ යුතු බවත්, භාණ්ඩය නිපදවීමට සාපේක්ෂව අඩු පිරිවැයකින් ආනයනය කළ හැකි නම් එම භාණ්ඩ ආනයනය කළ යුතු බවත් මින් අදහස් වේ.

**නිදසුන් :**

ශ්‍රී ලංකාව - ඇගළුම් නිෂ්පාදනය

## සමහර නිෂ්පාදිත සම්බන්ධ ව සමහර රටවල නීතිමය ඒකාධිකාරයක් තිබීම (Patant & Copyright)

## සමහර නිෂ්පාදන සඳහා අවශ්‍ය නිපුණතාව හා තාක්ෂණය සෑම රටකට ම නො මැති වීම හෝ සීමා වීම

**නිදසුන් :**

රොබෝ තාක්ෂණය

මෝටර් රථ තාක්ෂණය

ClassWork.LK

## භාණ්ඩ ප්‍රවර්ධනය

තම නිෂ්පාදිත ලොව පුරා අලෙවි කර ගැනීම සඳහා විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කිරීම

## වෙළෙඳ බාධක අවම වීම

වෙළෙඳාම සඳහා තිබූ තීරු බදු සහ තීරු බදු නො වන සම්බාධක බොහොමයක් ඉවත් වීම

ClassWork.LK

## විදේශ වෙළෙඳාමේ ප්‍රභේද

- ආනයන වෙළෙඳාම - Imports
- අපනයන වෙළෙඳාම - Exports
- ප්‍රති අපනයන - Re Exports
- අන්තරාල වෙළෙඳාම - Entrepot Trade

## ආනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකින් හෝ රටවලින් භාණ්ඩ හා සේවා ගෙන්වීම ආනයන වෙළෙඳාම වේ.

**නිදසුන් :**

ශ්‍රී ලංකාවට ජපානයෙන් මෝටර් රථ ගෙන්වීම

ClassWork.LK

# අපනයන වෙළෙඳාම

කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ හා සේවා යැවීම අපනයන වෙළෙඳාම වේ.

**නිදසුන් :**
ශ්‍රී ලංකාවෙන් ඉරාකයට තේ යැවීම

# ප්‍රතිඅපනයන වෙළෙඳාම

කිසියම් රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනැවිත් වෙනසකට භාජනය කර හෝ නො කර නැවත වෙනත් රටකට හෝ රටවලට යැවීම ප්‍රතිඅපනයන වෙළෙඳාම වේ. මෙහි දී ආනයන අවස්ථාවේ දී ගෙවූ තීරුබදු අපනයනය කරන විට ආපසු අය කර ගත හැකි ය.

**නිදසුන් :**
රෙදිපිළි සහ අනෙකුත් ද්‍රව්‍ය ආනයනය කර ඇඟළුම් සකස් කර වෙනත් රටකට අපනයනය කිරීම

ClassWork.LK

# අන්තරාල වෙළෙඳාම

විදේශ රටකින් ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට නො ගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමකින් තොර ව නැවත වෙනත් රටකට හෝ රටවලට අපනයනය කිරීම අන්තරාල වෙළෙඳාම ලෙස හැඳින්වේ. මෙම ක්‍රියාවලය වරාය තුළ සිදු වන නිසා තීරු ගාස්තු අය කිරීමක් සිදු නො වේ.

**නිදසුන් :**

ශ්‍රී ලංකාවට ඉන්දියාවෙන් තේ ආනයනය කර ඉරානයට අපනයනය කිරීම

ClassWork.LK

# රටක් විදේශ වෙළෙඳාමේ නිරත වීමෙන් අත් කර ගත හැකි ප්‍රතිලාභ

- අතිරික්ත නිෂ්පාදිත අපනයනය කළ හැකි වීම

- රටේ නිපදවිය නො හැකි නිෂ්පාදිත ආනයනය කළ හැකි වීම

- විදේශ විනිමය උපයා ගත හැකි වීම

- ආර්ථික පිරිමැසුම් අත් කර ගත හැකි වීම
  විදේශ වෙළෙඳාම නිසා දේශීය වෙළෙඳපොළට පමණක් නොව ගෝලීය වෙළෙඳපොළ සඳහා ද නිෂ්පාදනය කෙරේ. මෙසේ පුළුල් වෙළෙඳපොළක් සඳහා නිෂ්පාදනය මහා පරිමාණ ව සිදු කිරීම නිසා ආර්ථික පිරිමැසුම් ඇති කර ගත හැකි වේ.

- ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා හා ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය වීම

- නව තාක්ෂණික හා කළමනාකරණ නිපුණතා වර්ධනය වීම

ClassWork.LK

- ආර්ථික සංවර්ධනයට පිටුවහලක් වීම

**නිදසුන් :**

- රැකියා උත්පාදනය
- ජනතාවගේ ජීවන මට්ටම උසස් වීම
- සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම

ClassWork.LK

# නිදහස් වෙළෙඳාම

කිසිඳු බාධාවකින් තොර ව විවිධ පාර්ශ්වයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් පැවතීම නිදහස් වෙළෙඳාම වේ.

# නිදහස් වෙළෙඳාමට ඇති බාධක

නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරුබදු හා තීරුබදු නො වන බාධක ලෙස වර්ග කෙරේ.

- රටවල් අතර වෙළෙඳාමේ දී **තීරු බදු පැනවීම** නිදහස් වෙළෙඳාමට බාධාවක් වේ.

- තීරු බදු අය කිරීමට අමතර ව නිදහස් වෙළෙඳාමට බලපාන අනෙකුත් **බාධා තීරු නො වන බාධා** ලෙස හැඳින්වේ.

**නිදසුන් :**

- ආනයන සීමා කිරීම් / පංගු කිරීම්
- අපනයන සීමා කිරීම් / පංගු කිරීම්
- ආනයන/අපනයන තහනම් කිරීම්
- වෙළෙඳ ගිවිසුම්
- දැඩි විනිමය ප්‍රතිපත්ති

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# TRADE

# (Part-V)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ආනයන හා අපනයන වෙළෙඳ ගනුදෙනු

ආනයන හා අපනයන වෙළෙඳ ගනුදෙනු බොහෝ විට සිදු වන්නේ නියෝජිතයකු මාර්ගයෙනි.

නමුත් සෘජුව ම ඇණවුම් කර ගනුදෙනු සිදු වන අවස්ථා ද දක්නට ලැබේ.

කුමන ක්‍රමය අනුගමනය කළ ද ආනයන හා අපනයන ක්‍රියාපටිපාටියේ දී අවශ්‍ය වන ලියවිලිවල වෙනසක් සිදු නො වේ.

ClassWork.LK

# ආනයන ක්‍රියාපටිපාටිය

## විදේශ සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු, වාණිජ මණ්ඩල සඟරා හා ප්‍රකාශන, තානාපති කාර්යාල, වෙළෙඳ ප්‍රදර්ශන හා අන්තර් ජාල වෙබ් අඩවි තුළින් ලබා ගෙන සුදුසු විදේශීය සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

## මිල විමසුමක් යැවීම

සැපයුම්කරුවෙකු තෝරා ගැනීමෙන් අනතුරුව තමන් ආනයනය කිරීමට අදහස් කරන භාණ්ඩවල මිල ගණන් විමසීම සිදු කෙරේ. ඒ සඳහා තෝරා ගත් සැපයුම්කරු වෙත මිල විමසුමක් යැවේ.

## මිල කියුමක් ලැබීම

සැපයුම්කරු (අපනයනකරු ) භාණ්ඩ සැපයීමට එකඟ වන මිල ගණන් හා කොන්දේසි ඇතුළත් කර මිල විමසුමට පිළිතුරු ලෙස මිල කියුමක් ආනයනකරු වෙත එවනු ලබයි.

ClassWork.LK

## ආනයන බලපත්‍ර ලබා ගැනීම

සමහර නිෂ්පාදිත ආනයනය කිරීමේ දී ආනයන බලපත්‍රයක් ලබා ගත යුතු වේ. මෙය ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලැබේ. ආනයන බලපත්‍ර අවශ්‍ය භාණ්ඩ තීරණය කරනු ලබන්නේ ආනයන හා අපනයන පාලක විසිනි.

## ඇණවුම (ඉන්ඩෙන්ටුව) ඉදිරිපත් කිරීම

සැපයුම්කරුගේ මිල කියුමට ආනයනකරු එකඟ වන්නේ නම් ඇණවුමක් ඉදිරිපත් කළ යුතු වේ. මෙම ඇණවුම ඉන්ඩෙන්ටුව නමින් ද හඳුන්වයි.

## අපනයනකරුට ගෙවීම පිළිබඳ කටයුතු කිරීම

බොහෝ විට අපනයනකරුට ගෙවීම සඳහා ණයවර ලිපි සහ ණයපත් යොදා ගනී.

## භාණ්ඩ නිදහස් කර ගැනීම

අදාළ ගෙවීම් කිරීමෙන් පසු ව, නියමිත ලියවිලි ඉදිරිපත් කර භාණ්ඩ නිදහස් කර ගත හැකි ය.
**සැ.යු.** අවශ්‍ය වන ලියවිලි පසු ව විස්තර කෙරේ.

ClassWork.LK

# අපනයන ක්‍රියාපටිපාටිය

- අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම
- විදේශ ගැනුම්කරුවා සොයා ගැනීම
- අවශ්‍ය වන්නේ නම් අපනයන බලපත්‍ර ලබා ගැනීම
- ආනයනකරුගෙන් ලැබුණු මිල විමසුමට ප්‍රතිචාරයක් වශයෙන් මිල කියුමක් යැවීම
- ආනයනකරුගෙන් ඉන්ඩෙන්ටුව ලබා ගැනීම
- භාණ්ඩ තොගය නැව්ගත කිරීම සඳහා අවශ්‍ය ඉඩ වෙන්කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
- නැව්ගත කිරීමට සුදුසු වන ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම
- අපනයන භාණ්ඩ තොගය රක්ෂණය කිරීම
- භාණ්ඩ නැව්ගත කර නෞභාරපත ලබා ගැනීම
- මුදල් ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම

ClassWork.LK

# <u>ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියකියවිලි</u>

## <u>ආනයන /අපනයන බලපත්‍ර :</u>

ආනයනයේ දි හා අපනයනයේ දී බලපත්‍ර අවශ්‍ය වන භාණ්ඩ ආනයන හා අපනයන පාලක විසින් ප්‍රසිද්ධියට පත් කරයි. මේ සඳහා සම්බන්ධ වන ආයතන කිහිපයක් පහත දැක්වේ.

**නිදසුන් :**

**තේ** - ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**මැණික් හා ස්වර්ණාභරණ** - රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

**එළවළු , කුළුබඩු හා බුලත්** - ආනයන අපනයන පාලක දෙපාර්තමේන්තුව

## <u>ඉන්ඩෙන්ටුව/ඇණවුම (Indent /Order)</u>

සැපයුම්කරුවෙකුගේ මිල කියුම අනුව, ඔහුගෙන් භාණ්ඩ ලබා ගැනීමට ආනයනකරුවෙකු එකඟ වන්නේ නම්, ඒ සඳහා ඇණවුමක් අදාළ සැපයුම්කරු වෙත යැවිය යුතු ය. විදේශ වෙළෙඳාමේ දී මෙම ඇණවුම හැඳින්වෙන්නේ ඉන්ඩෙන්ටුව නමිනි.

ClassWork.LK

මෙම ඇණවුම් කිරීම අන්තර්ජාලය හරහා සිදු කළ හැකි ය. ආනයනකරුවෙකු විසින් විදේශීය සැපයුම්කරුවෙකු වෙත යවනු ලබන මෙම ඇණවුමෙහි ආනයනකරුට අවශ්‍ය භාණ්ඩ පිළිබඳ විස්තර, මිල, නැව්ගත කිරීමට අදාළ තොරතුරු ඇතුළත් කෙරේ.

## නෞභාරපත : Bill of Lading (B/L)

නැව් සමාගමක් වෙනුවෙන් නැව්පති හෝ ඔහුගේ නියෝජිතයකු විසින් අපනයනකරු වෙත නිකුත් කෙරේ. නෞභාරපත්‍රයේ සඳහන් භාණ්ඩ තොගය නැවට භාරගත් බවටත්, එම භාණ්ඩ අදාළ රටේ වරායට ගෙන ගොස් භාර දෙන බවටත් නැව් සමාගම මෙයින් පොරොන්දු වේ.

අපනයනකරු විසින් ආනයනකරුට මෙහි පිටපතක් යවන අතර භාණ්ඩ රැගත් නැව නියමිත වරායට ළඟා වූ විට ආනයනකරුට එම භාණ්ඩවල අයිතිය තහවුරු කිරීමට මෙය අවශ්‍ය වේ.

භාණ්ඩ පිළිබඳ විස්තර, අපනයනකරුගේ නම, ආනයනකරුගේ නම, නැවේ නම, භාණ්ඩ යවන වරාය යනා දී විස්තර මෙහි ඇතුළත් වේ.

ClassWork.LK

## ඉන්වොයිසිය (Invoice)

අපනයනය කරනු ලබන භාණ්ඩවල විස්තර, මිළ ගණන්, ගෙවීම් කොන්දේසි, ගමන් මාර්ගය, ප්‍රතික්ෂේප කිරීමේ කොන්දේසි ආදී විස්තර ඇතුළත් ලේඛනයකි.

## ප්‍රභවස්ථාන සහතිකය ( Letter of Origin)

නැව්ගත කරන භාණ්ඩ අපනයනය කරන රටේ නිපදවා ඇති බව සහතික කරමින් පිළිගත් වෙළෙඳ මණ්ඩලයකින් හෝ රාජ්‍ය ආයතනයකින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි. තීරුබදු සහන ලබා ගැනීමේ දී මෙම ලියවිල්ල වැදගත් වේ.

**නිදසුන් :**

ශ්‍රී ලංකාවෙන් යුරෝපා සංගමයට භාණ්ඩ අපනයනය කරන විට එම භාණ්ඩ ශ්‍රී ලංකාවේ නිපද වූ බවට ආයෝජන මණ්ඩලය හෝ කර්මාන්ත අමාත්‍යාංශය ප්‍රභවස්ථාන සහතිකය නිකුත් කරයි.

ClassWork.LK

## ණයවර ලිපිය - (Letter of Credit (L/C)

ආනයන අපනයන වෙළෙඳාමේ දී අපනයනකරුට මුදල් ගෙවීම සඳහා බහුල ව භාවිත කෙරෙන මාධ්‍යයකි. ආනයනකරුගේ ඉලලීම මත, ආනයනකරු වෙනුවෙන්, ඔහුගේ බැංකුව විසින් අපනයනකරුගේ බැංකුව වෙත ණයවර ලිපිය නිකුත් කෙරේ. අපනයනකරු විසින් ආනයනකරුවකු වෙත අපනයනය කරනු ලබන භාණ්ඩවලට මුදල් ගෙවීම් තහවුරු කිරීම සඳහා ආනයනකරුගේ බැංකුව නිකුත් කරන ලියවිල්ලකි.

## ආනයන සටහන්කරය (Import entry)

ආනයනකරු වෙනුවෙන් වරායට ලැබී ඇති භාණ්ඩ පිළිබඳ අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් රේගුව වෙත ඉදිරිපත් කළ යුතු ලියවිල්ල යි. නෞභාරපත හෝ ඉන්වොයිසිය ඇසුරෙන් මෙය පිළියෙල කෙරේ.

## අපනයන සටහන්කරය (Export entry)

අපනයනකරු අපනයනය කිරීමට අපේක්ෂා කරන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර අපනයනකරු විසින් අපනයන රටේ රේගුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල යි.

ClassWork.LK

## රක්ෂණ සහතිකය ( Insurance Certificate)

අපනයනයට අදාළ භාණ්ඩ තොගය අපනයනය කිරීමේ දී, එම භාණ්ඩ තොගය රක්ෂණය කර අපනයනකරු හෝ ආනයනකරු ලබා ගන්නා රක්ෂණ සහතිකයයි. විකුණුම් ගිවිසුම අනුව රක්ෂණ සහතිකය ලබා ගැනීම අපනයනකරු හෝ ආනයනකරු විසින් සිදු කරනු ලබයි.

## වේදිකා කුවිතාන්සිය /වාප්පුකාර කුවිතාන්සිය (Wharfinger's Receipt)

රේගුවට භාණ්ඩ භාරදුන් පසු එම භාණඩ භාරගත් බව සඳහන් කරමින් රේගුව විසින් අපනයනකරුට නිකුත් කරන ලියවිල්ලයි.

ClassWork.LK

## හානිරක්ෂණ ලිපිය (Letter of Indemnity)

දූෂ්‍ය නෞභාරපත්‍රයක් නිකුත් කිරීමේ තත්ත්වයක් ඇති අවස්ථාවක දී කැඩී බිඳීම් හෝ පලුදු වීම් ඇති එම භාණ්ඩ තොගයේ අනාගත සියලු අවදානම් අපනයනකරු භාර ගන්නා බව සඳහන් කරමින් පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීම සඳහා අපනයනකරුවකු විසින් නැවේ කපිතාන් වෙත නිකුත් කරන ලියවිල්ලයි. නැවට පටවන ලද භාණ්ඩ හොඳ තත්ත්වයේ පවතින විට නිකුත් කරන නෞභාරපත පාරිශුද්ධ නෞභාරපත වේ. නැවට පටවන යම් යම් භාණ්ඩ හෝ මුළු තොගය ම හෝ කැඩීම් බිඳීම් හෝ පලුදු සහිත වේ යැයි සඳහන් කර නිකුත් කරන ලියවිල්ල දූෂ්‍ය නෞභාරපත වේ.

## සනීපාරක්ෂක සහතිකය /සෞඛ්‍යය සහතිකය (Sanitary Certificate/Health Certificate)

ආනයන රටේ අවශ්‍යතාව මත යම් රටක් අපනයනය කරන ඇතැම් කෘෂි නිෂ්පාදිතවල පාරිභෝජන යෝග්‍යතාව තහවුරු කරමින් එම රටේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරන ලියවිල්ලකි.

**නිදසුන් :**

කෘෂි නිෂ්පාදන සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මත්ස්‍ය නිෂ්පාදන සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

ClassWork.LK

## ගුදම් බලපත්‍රය

වරාය ආශ්‍රිත ගබඩා ගුදම් (Warehouse) ලෙස හැඳින්වේ. ගුදමක භාණ්ඩ තැන්පත් කළ විට ගුදම් අධිකාරීන් ඒ බව සහතික කරමින් ආනයනකරු වෙත නිකුත් කරන ලියවිල්ල ගුදම් බලපත්‍රය වේ. ගුදමේ තිබිය දී ම භාණ්ඩවල අයිතිය වෙනත් කෙනෙකුට පවරන්නේ නම්, ගුදම් බලපත්‍රය පැවරීමෙන් එය කළ හැකි ය. එම නිසා ගුදම් බලපත්‍රය පැවරිය හැකි ලියවිල්ලකි.

ClassWork.LK

## විදේශ වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රම

## ණයවර ලිපි විවෘත කිරීම මගින්

## බැංකු අණකර මගින්

යම් පුද්ගලයකු විසින් සිය බැංකුවට අදාළ මුදල හා නියමිත ගාස්තු ගෙවා, දෙන ලද උපදෙස් පරිදි නම් කරනු ලැබූ මුදල් ප්‍රමාණයක් ලැබිය යුතු තැනැත්තාට ගෙවන ලෙස අණ කරමින් මුදල් යවන්නාගේ බැංකුව විසින් මුදල් ලැබිය යුතු තැනැත්තාගේ බැංකුවට හෝ නියෝජිත බැංකුවට නිකුත් කරන ලියවිල්ලයි.

මෙය විදේශීය ගෙවීම් සඳහා මෙන් ම දේශීය ගෙවීම් සඳහා ද භාවිත කරයි.

ClassWork.LK

## විද්‍යුත් ගෙවීම් ක්‍රම මගින්

වර්තමානයේ අන්තර්ජාල සබඳතා උපයෝගී කර ගෙන මුදල් ගෙවිය හැකි ක්‍රම මෙයට අයත් වේ.

**නිදසුන් :**

ණයකාඩ්පත - (credit card)

මුදල් ගෙවීම් සඳහා බහුල ව මෙම ක්‍රමය භාවිත කරයි. visa, Master, Americam Express වැනි කාඩ්පත් බැංකුවක් හරහා ලබා ගත හැකි අතර අන්තර්ජාලය හරහා ගෙවීම් මාධ්‍යයක් ලෙස භාවිත කරයි.

## අන්තර්ජාල පෙර-ගෙවුම් කාඩ්පත් (Internet pre-paid card)

අවශ්‍ය මුදල් ප්‍රමාණය අදාළ කාඩ්පතට තැන්පත් කර අවශ්‍ය ගෙවීම් සිදු කිරීම සඳහා තාවකාලික ව භාවිත කරන කාඩ්පතකි.

ClassWork.LK

# අන්තර්ජාල පෙර-ගෙවුම් පහසුකම්
# (Internet pre-paid facility)

තමන්ගේ බැංකු ගිණුමක් මගින් ගෙවීම් සිදු කරන අතර ගෙවීම් සඳහා විධානය දීමට අන්තර්ජාල බැංකු පහසුකම් (Internet banking) භාවිත කරයි. වර්තමානයේ බොහෝ බැංකු තම ගිණුම් හිමියන්ට මෙම පහසුකම් ලබා දෙන අතර සේවාව අවශ්‍ය අය ලියාපදිංචි වී තමන්ට ලැබෙන ගිණුම් හිමියාගේ නම හා මුරපදය (user name/ password) භාවිත කර අදාළ වෙබ් අඩවියට පිවිස ගෙවීම් කළ හැකි ය.

ClassWork.LK

# විද්‍යුත් ගෙවීම් සේවා ආයතන හරහා ගෙවීම
# (Electronic pay ment systems)

යම් ගෙවීමක් කිරීමේ දී අදාළ භාණ්ඩය හෝ සේවාව ලබා ගත් ආයතනයට සෘජුවම ගෙවීම් නොකර පිළිගත් ගෙවීම් ආයතනයක් හරහා ගෙවීම් කිරීමේ ක්‍රමයකි.

**නිදසුන් ඃ**

www paypal.com

මෙම ක්‍රමයට ගෙවීම් කිරීමේ දී ප්‍රථමයෙන් paypal පද්ධතිය තුළ ලියාපදිංචි වී, බැංකු ගිණුම් හෝ ණයපත් තොරතුරු paypal ආයතනයට ලබා දී paypal පද්ධතිය හරහා ගෙවීම් කළ හැකි ය.

මෙහි දී ගිණුම පිළිබඳ තොරතුරු බාහිර පාර්ශ්වයන්ට ලබා දීමක් සිදු නො වේ.

ClassWork LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# TRADE

# (Part-VI)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# වෙළෙඳ කලාප

රටවල් කිහිපයක් විසින් බදු, තීරු ගාස්තු සහ වෙළෙඳාම පිළිබඳ ව ගිවිසුමකට එළඹී කටයුතු කරන  නිදහස් වෙළෙඳ ප්‍රදේශයක්, වෙළෙඳ කලාපයක් (Trade Bloc) ලෙස හඳුන්වයි.

වෙළෙඳ කලාප නිදහස් වෙළෙඳ ප්‍රදේශ (Free trade areas), වෙළෙඳ හවුල්, වෙළෙඳ සංගම් යන නම්වලින් ද හඳුන්වයි.

වෙළෙඳ කලාපවලට නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- යුරෝපීය සංගමය (EU )
- ආසියන් සංගමය (ASEAN )
- රටවල් අටේ කණ්ඩායම (G8)

ClassWork.LK

# යුරෝපීය සංගමය European Union (EU)

යුරෝපයේ පිහිටි රටවල් 26 කින් මෙය සමන්විත වේ. 1957 දී යුරෝපීය රටවල් 6 ක් විසින් අත්සන් තබන ලද රෝම ගිවිසුම (Treaty of Rome) මගින් පිහිටුවන ලද යුරෝපීය ආර්ථික ප්‍රජාව (Eropean Economic Community) මෙහි මූලාරම්භයයි.

මෙහි සාමාජික රටවල් පොදු වෙළෙඳ ප්‍රතිපත්තියක්, කෘෂි හා ධීවර ප්‍රතිපත්තියක්, ප්‍රාදේශීය සංවර්ධන ප්‍රතිපත්තියක් පවත්වා ගෙන යන අතර, 1999 දී EU විසින් යූරෝ (Euro) නමින් පොදු මුදල් ඒකකයක් හඳුන්වා දී ඇත.

## EU සාමාජික රටවල් :

- ඔස්ට්‍රියා
- බෙල්ජියම
- බල්ගේරියා
- පින්ලන්තය
- සයිප්‍රස්
- මෝල්ටා
- සෙච් රිපබ්ලික් (Czech Republic)
- ඉතාලිය
- රුමේනියාව
- ස්වීඩන්
- ඩෙන්මාක්
- ලිතුවේනියා
- නෙදර්ලන්තය
- සොල්වේකියා
- එස්ටෝනියා
- ලැට්විියා
- පෝලන්තය
- සොල්වේනියා
- ප්‍රංශය
- ජර්මනිය
- ග්‍රීසිය
- හංගේරියාව
- අයිස්ලන්තය
- ලක්සම්බර්ග්
- පෘතුගාලය
- ස්පාඤ්ඤය

ClassWork.LK

# අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංවිධානය (ආසියන් සංගමය) (Association of South East Asian Nations) (ASEAN)

ඈත පෙරදිග ආසියාවේ රටවල් 10 ක දේශපාලනික හා ආර්ථික සහයෝගීතා සංගමයකි. 1961 දී පිලිපීනය, මැලේසියාව, තායිලන්තය, යන රටවල් තුන එක් ව පිහිට වූ ඈත පෙරදිග ආසියානු සංගමය (Association of Southeast Asia) මෙහි මූලාරම්භයයි. ඉහත රටවල් තුන 1967 දී ඉන්දුනීසියාව හා සිංගප්පූරුව සමග එකතු වී ASEAN සංවිධානය පිහිටුවන ලදී.

## ASEAN සාමාජික රටවල්

- පිලිපීනය
- ඉන්දුනීසියාව
- වියට්නාමය
- කාම්බෝජය
- මැලේසියාව
- සිංගප්පූරුව
- ලාඕසය
- තායිලන්තය
- බෲනායි
- මියන්මාරය

ClassWork.LK

# රටවල් අටේ කණ්ඩායම

# Group of Eight (G8)

ලෝකයේ ප්‍රධාන පෙළේ රටවල් 08 ක් විසින් පිහිටුවාගත් ජාත්‍යන්තර සංගමයකි. 1973 දී ඇති වූ තෙල් අර්බුදයත්, ගෝලීය ආර්ථික ප්‍රපාතනයත් මෙම සංසදය බිහිවීමට බලපෑ අතර, 1974 දී ඇමරිකා එක්සත් ජනපදය, බටහිර ජර්මනිය, ජපානය සහ ප්‍රංශය යන රටවල් නිල නො වන කණ්ඩායමක් වශයෙන් එක් වීම මෙහි මූලාරම්භයයි. 1997 දී රුසියාව නිල වශයෙන් G7 සමුළුවට සම්බන්ධ වීමත් සමග මෙය G8 ලෙස නම් කෙරිණි.

## G8 සාමාජික රටවල්

- ඇ.එ.ජ. (USA)
- බටහිර ජර්මනිය
- කැනඩාව
- එක්සත් රාජධානිය (UK)
- ඉතාලිය
- රුසියාව
- ප්‍රංශය
- ජපානය

ClassWork.LK

## වෙළෙඳ ගිවිසුම්

රටවල් දෙකක් හෝ කිහිපයක් අතර යම් කාලපරිච්ඡේදයක් තුළ වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා ඇති කර ගන්නා එකඟතාව වෙළෙඳ ගිවිසුම් ලෙස හැඳින්වේ. රටවල් දෙකක් අතර ඇති වන ගිවිසුම් ද්වි පාර්ශ්වීය ගිවිසුම් ලෙසත්, රටවල් කිහිපයක් අතර ඇති වන ගිවිසුම් බහු පාර්ශ්වීය ගිවිසුම් ලෙසත් හැඳින්වේ.

## වෙළෙඳ ගිවිසුම්වලට නිදසුන්

- උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාපය (SAFTA)
- ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම (APTA)

ClassWork.LK

# උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම

# North American Free Trade Agreement (NAFTA)

ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව හා මෙක්සිකෝව යන රටවල් තුන සාමාජිකත්වය දරන මෙම ගිවිසුම ආරම්භ වූයේ 1994 ජනවාරි පළමුවන දා සිටයි. මෙම රටවල් තුන අතර වෙළෙඳ බාධා ඉවත් කිරීම, තීරු බදු ඉවත් කිරීම, ශ්‍රමය හුවමාරු කර ගැනීම සම්බන්ධ කොන්දේසි ගිවිසුමෙහි ඇතුළත් වේ. මෙම ගිවිසුමෙහි ඇති විශේෂ ලක්ෂණය වන්නේ ඉහත රටවල් තුනෙහි නිෂ්පාදිතවලට පමණක් ගිවිසුම සීමා වීමයි.

වෙනත් රටක නිපද වූ භාණ්ඩ මෙම රටවල් තුන අතර හුවමාරු වීමේ දී තීරු ගාස්තු ක්‍රියාත්මක වේ. තීරු ගාස්තු නිදහස් වනුයේ ඇමරිකා එක්සත් ජනපදයේ නිපදවන ලදී (Made in USA), කැනඩාවේ නිපදවන ලදී (Made in Canada) හෝ මෙක්සිකෝවේ නිපදවන ලදී (Made in Mexico) යනුවෙන් සඳහන් නිෂ්පාදිත සඳහා පමණි.

ClassWork.LK

# දකුණු ආසියානු නිදහස් වෙළෙඳ කලාපය

# South Asian Free Trade Area (SAFTA)

සාක් කලාපීය වෙළෙඳ සහයෝගීතාව ව්‍යාප්ත කිරීමටත්, දකුණු ආසියාව තුළ නිදහස් වෙළෙඳ ප්‍රදේශයක් ඇති කර ගැනීමටත්, සාක් කලාපීය රටවල ආර්ථික පිළිවෙත් ගෝලීයකරණයට අනුගත කිරීමටත් ඇති කර ගත් එකඟතාවයි.

2004 වර්ෂයේ ඉස්ලාමාබාද්හි දී පැවති 12 වන SAARC සමුළුවේ දී මෙම ගිවිසුම අත්සන් කරන ලදී.

සෆ්තා (SAFTA) ගිවිසුමට එළැඹීමෙන් එම ගිවිසුමට එළැඹි රාජ්‍යයන් අතර ආනයන සඳහා කිසිඳු බාධාවකින් තොර ව තීරු බදු ඉවත් කිරීම, වරාය හා ප්‍රවාහන පහසුකම් ඇති කිරීම, වෙළෙඳාමට සම්බන්ධ සේවා සැපයීම යනාදිය සම්බන්ධයෙන් සාමුහික එකඟතා ඇති කර ගන්නා ලදී.

ClassWork.LK

# ආසියා පැසිපික් වෙළෙඳ ගිවිසුම

# Asia - Pacific Trade Agreement ^APTA&

1975 වර්ෂයේ බැංකොක් ගිවිසුම නමින් ආරම්භ වූ මෙම ගිවිසුම 2005 නොවැම්බර් 02 වන දින සිට ආසියා-පැසිපික් වෙළෙඳ ගිවිසුම යනුවෙන් නම් කරන ලදී. මෙහි සාමාජික රටවල් වනුයේ බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, මොංගෝලියාව, ශ්‍රී ලංකාව හා දකුණු කොරියාව ය. ආසියා පැසිපික් කලාපයේ ඇති පැරණි ම වරණීය වෙළෙඳ ගිවිසුම වන්නේ මෙම ගිවිසුමයි.

සාමාජික නො වන රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට වඩා සහනදායී ලෙෂ සාමාජික රටවලින් භාණ්ඩ හා සේවා ආනයනය කිරීමට හැකි වන පරිදි වෙළෙඳ බාධක හැකිතාක් අවම කරමින් සාමාජික රටවල් අතර ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම මෙම ගිවිසුමේ අරමුණ වේ.

ClassWork.LK

# ජාත්‍යන්තර සංවිධාන

විදේශ වෙළෙඳාමට එරෙහි වන තීරු බදු, විනිමය පාලන නීතිරීති, රේගු නීතිරීති වැනි විවිධ බාධා අවම කර ගැනීමට පිහිටුවා ගෙන ඇති සංවිධාන ජාත්‍යන්තර සංවිධාන ලෙස හැඳින්වේ.

## ජාත්‍යන්තර සංවිධානවලට නිදසුන්

- ලෝක වෙළෙඳ සංවිධානය (WTO)
- සාර්ක් සංවිධානය (SAA RC)
- ආසියානු සංවර්ධන බැංකුව (ADB)
- ලෝක බැංකුව (IBRD)
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)

ClassWork.LK

# <u>ලෝක වෙළෙඳ සංවිධානය</u>

# <u>World Trade Organization (WTO)</u>

ජාත්‍යනත් ර වෙළෙඳාම ලිහිල් කිරීමට හා සුපරීකෂ්ණය සඳහා සථ්ාපිත කරන ලද ජාත්‍යනත්ර සංවිධානයකි. 1995 ජනවාරි 01 දින ආරම්භ වූ මෙම සංවිධානය ගෝලීය මට්ටමින් ජාතීන් අතර වෙළෙඳ නීතිරීති සම්බන්ධව කටයුතු කරයි. WTO හි ප්‍රධාන කාර්යාලය ස්විස්ටර්ලන්තයේ ජිනීවා හි පිහිටුවා ඇත. වෙළෙඳාමේ ප්‍රවර්ධනය සඳහා ජාතීන් අතර සාකච්ඡා පැවැත්වීමට අවකාශ සැලසීමත්, වෙළෙඳ බාධා පහත හෙළීමත්, සාමාජික රටවල ජනතාවගේ සුබසාධනය නංවාලීමටත් WTO වල ප්‍රධාන ඉලක්කයයි.

Class Work LK

# දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමය

# South Asian Association for Regional Co-operation (SAARC)

දකුණු ආසියාතික රටවල් අට ක ආර්ථික හා දේශපාලනික සංගමයකි. 1985 දෙසැම්බර් මස 08 වන දින මෙම සංවිධානය ස්ථාපිත කරන ලදී.

SAARC සංවිධානයේ සහයෝගීතා කටයුතු ක්ෂේත්‍ර පහක් යටතේ සිදු වේ.

- කෘෂිකර්මාන්තය හා ග්‍රාමීය සංවර්ධනය
- විදුලි සංදේශ, විද්‍යාව, තාක්ෂණය හා දේශගුණික විද්‍යාව
- සෞඛ්‍යය හා ජනගහන කටයුතු
- ප්‍රවාහනය
- මානව සම්පත් සංවර්ධනය

ClassWork.LK

# SAARC සාමාජික රටවල්

- ශ්‍රී ලංකාව
- බංගලාදේශය
- භූතානය
- ඉන්දියාව
- නේපාලය
- ඇෆ්ගනිස්ථානය
- පාකිස්ථානය
- මාලදිවයින

ClassWork.LK

# ආසියානු සංවර්ධන බැංකුව

# Asian Development Bank (ADB)

1966 දෙසැම්බර් 19 වනදා ආසියානු සංවර්ධන බැංකුව ආරම්භ විය. පිලිපීනයේ මැනිලා නුවර මෙහි මූලස්ථානය පිහිටා ඇත. වර්තමානයේ රටවල් 67 ක් මෙහි සාමාජිකත්වය ලබා ඇති අතර ඉන් රටවල් 48 ක් ආසියා කලාපයෙන් ද රටවල් 19 ක් පැසිපික් කලාපයෙන් ද වේ. සාමාජික රටවල සමාජයීය හා ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙහි අරමුණ වේ. ඒ සඳහා සාමාජික රටවලට ණය හා ප්‍රතිපාදන සපයමින් එම රටවල දුප්පත්කම නැති කිරීමට මෙම බැංකුව කටයුතු කරයි.

ClassWork.LK

# ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (ලෝක බැංකුව)

# International Bank for Reconstruction and Development (IBRD)

දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් වූ යුරෝපා ආර්ථිකය ගොඩ නැංවීම උදෙසා වූ බ්‍රෙට්න් වුඩ්ස් (Bretton Woods ) ගිවිසුම මගින් 1945 දෙසැම්බර් 27 දින ආරම්භ විය.

සංවර්ධනය වන රටවල දුප්පත්කම පහත හෙලීමේ අරමුණින් එම රටවල සංවර්ධන වැඩසටහන් සඳහා ණය සපයන බැංකුව ලෙස මෙම බැංකුව හඳුන්වයි.

තිරසර සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ දුප්පත්කම තුරන් කිරීම ලෝක බැංකුවේ ප්‍රධාන ඉලක්ක වේ.

ClassWork.Lk

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

# International Monitary Fund (IMF)

මූල්‍ය හා තාක්ෂණික ආධාර ලබා දීමේත් විනිමය අනුපාත හා ගෙවුම් ශේෂ නිරීක්ෂණය කිරීමේත් ජාත්‍යන්තර සංවිධානය ලෙස IMF හැඳින්විය හැකි ය. මෙහි ප්‍රධාන කාර්යාලය ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් නගරයේ පිහිටුවා ඇත.

මෙය ගෝලීය මූල්‍ය සහයෝගීතාව දියුණු කිරීම, මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම, ජාත්‍යන්තර වෙළෙඳාමට පහසුකම් සැලසීම, රැකීරක්ෂා පුළුල් කිරීම, තිරසර ආර්ථික සංවර්ධනය හා දුප්පත්කම අඩු කිරීම අරමුණු කර ගෙන ආරම්භ කර ඇත.

ClassWork.LK

# වෙළෙඳ සංගම්, වෙළෙඳ ගිවිසුම් හා ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළෙඳාමට ඇති කරන විවිධ බලපෑම්

- නිදහස් වෙළෙඳාමට එරෙහි තීරුබදු හා තීරුබදු නො වන බාධා ඉවත් වීම

- රටවල් අතර සහයෝගීතාව වර්ධනය වීම

- වෙළෙඳ ගිවිසුම් හරහා තම රටේ නිෂ්පාදිත සඳහා ස්ථිර වෙළෙඳපොළක් හිමි වීම

- ස්ථිර මිලක් ලැබීම නිසා මිල උච්ඡාවචනවලින් අවාසි සිදු වීම අවම වීම

- සාමාජික සෑම රටකට ම සමාන වරප්‍රසාද හිමි වීම

- ගෝලීය මූල්‍ය සහයෝගීතාව වර්ධනය වීම හා මූල්‍ය ස්ථායීතාව සහතික වීම

- රැකී රක්ෂා පුළුල් වීම හා තිරසර ආර්ථික සංවර්ධනය සහ දුප්පත්කම අඩු වීම

Classwork LK

# විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා

- විද්‍යුත් වාණිජ්‍ය හරහා විදේශ වෙළෙඳාම ලොව පුරා ම ව්‍යාප්ත වීම

- ආර්ථික වර්ධනය වේගවත් කර ගැනීමටත්, ආර්ථික අර්බුද වලට ශක්තිමත් ව මුහුණ දීමටත්, නව වෙළෙඳ කලාප හා වෙළෙඳ හවුල් ඇති වීම

- සාම්ප්‍රදායික අපනයනවලට සීමා නො වී ඉහළ තාක්ෂණයකින් යුතු නිෂ්පාදිත විවිධාංගීකරණය කෙරෙහි යොමු වීම

- ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදිත දිරිගැන්වීම සඳහා විදේශ වෙළෙඳ ප්‍රතිපත්තියට යොමු වීම

- ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ පැස පිළිබඳ වර්තමානයේ අවධානය යොමු වෙමින් පැවතීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

# TRADE

# (Part-VII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# විද්‍යුත් ව්‍යාපාර


වෙළෙඳ කටයුතුවලට අමතර ව නිෂ්පාදන, අලෙවිකරණ, ගිණුම්කරණ, මානව සම්පත්, කළමනාකරණ කටයුතු ආදී සියලු ම අභ්‍යන්තර ක්‍රියාවලීන් පරිගණක ජාල භාවිත කරමින් සිදු කරන ව්‍යාපාර විද්‍යුත් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

විද්‍යුත් ව්‍යාපාරයක පවතින අංශ අතර සිදු වන තොරතුරු හුවමාරුව සහ සමායෝජන කටයුතු සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කරයි.

ClassWork.LK

# විද්‍යුත් වාණිජ්‍ය

විද්‍යුත් වාණිජ්‍ය යනු විද්‍යුත් ව්‍යාපාරවල එක් කොටසක් පමණි. එනම් වෙළෙඳ කටයුතු හා වෙළෙඳාම සඳහා සහාය වන ප්‍රවාහන, සන්නිවේදන, බැංකු වැනි උපකාරක සේවා කටයුතු ද විද්‍යුත් ජාල ඔස්සේ සිදු කිරීමයි.




ClassWork.LK

# විද්‍යුත් වෙළෙඳාම

විද්‍යුත් වෙළෙඳාම යනු භාණ්ඩ හා සේවා මිල දී ගැනීම හා විකිණීමේ කටයුතු අන්තර්ජාලය ප්‍රමුඛ පරිගණක ගත තොරතුරු පද්ධති හරහා සිදු කිරීමයි.

## විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය

- අන්තර්ජාලය ඔස්සේ ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම

- වෙළෙඳ ගනුදෙනුව සංවිධානය කර ගැනීම

- භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදු වීම

- ගනුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම

ClassWork.LK

# විද්‍යුත් වෙළෙඳාමෙන් ව්‍යාපාරිකයාට, ගනුදෙනුකරුවාට හා සමාජයීය වශයෙන් ලැබෙන වාසි

## ව්‍යාපාරිකයාට ලැබෙන වාසි

- වඩාත් කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබා දිය හැකි නිසා කීර්තිනාමය හා ලාභය වැඩි වීම

- පිරිවැය වාසි අත්වීම

  **නිදසුන් :**
  තොග සම්බන්ධ පිරිවැය අවම වීම
  ලිපි ද්‍රව්‍ය හා සන්නිවේදනය සඳහා පිරිවැය අවම වීම
  අතරමැදියන් අවම වීම නිසා පිරිවැය අවම වීම

- භූගෝලීය සීමා නො මැති වීම නිසා වෙළෙඳපොළ පුලුල් වීම

ClassWork.LK

## පාරිභෝගිකයාට ලැබෙන වාසි

- භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම
- පහසුවෙන් හා ඉක්මණින් ඇණවුම් කළ හැකි වීම
- දවසේ පැය 24 පුරා ම ගනුදෙනු කළ හැකි වීම
- නිෂ්පාදිතයේ මිල මට්ටම සාපේක්ෂව අඩු වීම

## සමාජයීය වශයෙන් ලැබෙන වාසි

- පාරිභෝගිකයින්ගේ ජීවන තත්වය ඉහළ යාම
- නව භාණ්ඩ පරිහරණයට ඉඩකඩ සැලසීම
- නව වෙළෙඳපොළවල්, සහ රැකියා අවස්ථා උදා වීම

ClassWork.LK

# විද්‍යුත් වෙළෙඳාමේ සීමා

- අන්තර්ජාල පහසුකම් සෑම ප්‍රදේශයක ම ව්‍යාප්ත නොවීම

- භාවිතය පිළිබඳ ව පාරිභෝගිකයින්ගේ දැනුම මදිකම

- ගෙවීම් ක්‍රමවල පවතින ගැටලු

- බදු අයකිරීම් වැනි නීතිමය සීමා

- විද්‍යුත් ක්‍රම පිළිබඳ ව විශ්වාසය නො මැතිකම

- පරිගණක පද්ධති ආශ්‍රිත ව වංචා හා දූෂණ සිදු වීම

ClassWork.LK

# විද්‍යුත් වෙළෙඳාම සිදු වන ආකාර

## B2B - ව්‍යාපාරිකයාගෙන් ව්‍යාපාරිකයාට

ව්‍යාපාරයක් තවත් ව්‍යාපාරයක් සමග සිදු කරන ගනුදෙනු වේ.

**නිදසුන් :**

ව්‍යාපාරයකින් ව්‍යාපාරයකට අන්තර්ජාලය හරහා ඇණවුම් ලැබීම

## B2C - ව්‍යාපාරිකයාගෙන් පාරිභෝගිකයාට

ව්‍යාපාරයක් යම් භාණ්ඩයක් හෝ සේවාවක් අන්තර්ජාලය හරහා පාරිභෝගිකයින්ට අලෙවි කිරීම. මෙය විද්‍යුත් සිල්ලර වෙළෙඳාම E-tailing ලෙස ද හැඳින්වේ.

## C2C-පාරිභෝගිකයාගෙන් පාරිභෝගිකයාට

යම් පාරිභෝගිකයෙකු විසින් තවත් පාරිභෝගිකයෙකුට භාණ්ඩ හෝ සේවා අන්තර්ජාලය හරහා අලෙවි කිරීමයි.

නිදසුන් : ebay වෙබ් අඩවිය හරහා සිදු වන ගනුදෙනු

ClassWork.LK

## G2C - රජයෙන් පුරවැසියන්ට

රාජ්‍ය සේවා සඳහා යම් යම් ගෙවීම් සිදු කිරීම හා සේවා ලබා ගැනීම යි.

**නිදසුන් :**

බස්නාහිර පළාතේ ජනතාවට තම වාහන බලපත්‍ර අලුත් කර ගැනීම www.motortraffic.wp.gov.lk වෙබ් අඩවිය හරහා සිදු කළ හැකි වීම

## B2G - ව්‍යාපාරිකයාගෙන් රජයට

ව්‍යාපාරිකයින් විසින් රජයට අන්තර්ජාලය හරහා යම් යම් ගෙවීම් සිදු කිරීම හා සේවා සැපයීමයි.

**නිදසුන් :**

සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් කිරීම

ClassWork.LK

## G2B - රජයෙන් ව්‍යාපාරිකයාට

නිදසුන් :

අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)

## C2G - පුරවැසියන්ගෙන් රජයට

**නිදසුන් :**

බිල්පත්, විභාග ගාස්තු, බලපත්‍ර ගාස්තු ආදිය ගෙවීම විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura

A/L NOTE BOOK
All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."